තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2010

-----------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 විගණන මතය

----------------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-----------------------------------------

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති.

-------------------------------

ප්‍රමිත අංක 18 ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී, අදාල වත්කමට අයත් වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2008 වර්ෂයේදි වාහන පත්‍යාගණනය කිරීමේදී ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

1.2.2 ගණකාධිකරණ අඩුපාඩු.

---------------------------

පහත දැක්වෙන ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂවලදී සහ සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු. 2,101,595 ක් හා රු. 821,033 ක් ප්‍රත්‍යාගණන සංචිතයෙන්, මෙහෙයුම් සංචිතයට මාරු කර තිබුණි.

(ආ) රාජ්‍ය අංශයේ පුහුණු ආයතන සඳහා රු.6,156,450 ක මූල්‍යාධාර ලබා දී තිබුණද, ගිණුම්වල රු.5,720,771 ක් ලෙස දැක්වීම නිසා රු.435,634 කින් වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ජාතික තරුණ සේවා සභාවට ලබා දී තිබූ රු 1,963,175 කින් රු 1,877,605 ක් වියදම් කර තිබුණි. ඉතිරි රු. 85,570 ක මුදල ලැබිය යුතු ලෙස දක්වා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට රු 3,360,399 ක් ලබා දී තිබුණු අතර ඉන් රු 1,945,811 ක් වියදම කර තිබුණි. ඉතිරි රු 1,414,588 ක මුදල ලැබිය යුතු ලෙස දක්වා නොතිබුණි.

### 1.2.3 නොසැසඳු පාලන ගිණුම්

---

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාලව ඉදිරිපත් කර ඇති උපයෝගී ලේඛනවල දැක්වෙන ගිණුම් විෂයන් 2 ක ශේෂ අතර, එකතුව රු.2,366,196 ක නොසැසඳුණු වෙනස්කම් නිරීක්ෂණය විය.

### 1.2.4 ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්.

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ සිට රාජ්‍ය ආයතනයකින් රු.120,000 ක ලබාදෙන ලද අත්තිකාරම් ශේෂයක් අයවිය යුතුව පැවතුණි.

(ආ) 2006 වර්ෂයේදී සේවයෙන් ඉවත්කළ නිලධාරියකුගෙන් අයවිය යුතු එකතුව රු.58,445 ක්වූ ණය ශේෂ 02 ක් සහ රු. 300 ක් වූ උත්සව අත්තිකාරම් මුදලක් නිතීමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් හිහව පැවතුණි.

### 1.2.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

---

පහත සඳහන් ගිණුම් විෂයයන් එවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | නොලද සාක්ෂි |
|---|---|---|
| ශිෂ්‍ය ප්‍රගති වාර්තා පොත් | 109,708 | ශේෂ සනාථ කිරීම්<br>උපලේඛන<br>සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ණයගැතියෝ | 568,305 | ශේෂ සනාථ කිරීම් |
| ජාතික නිපුණතා සම්මත | - | තොග ලේඛන<br>උපලේඛන<br>සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 50,000 | ගෙවීම් වවුචර්, උපලේඛන |

| | | |
|---|---|---|
| දුරකථන ගාස්තු | 120,000 | එම |
| පුහුණු දීමනා | 17,000 | එම |
| ගමන් වියදම් | 20,000 | එම |

### 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය | |
| i. XXIV 4.5 වගන්තිය | සේවය හැරගීය හා වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු 192,850 ක් මුදල ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට 2011 මාර්තු 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි. |
| ii. XXIV 13.1වගන්තිය | සේවකයකු සේවයේ රඳවා ගැනීම අවිනිශ්චිත අවස්ථාවක වැටුප් අත්තිකාරම් ලබා නොදීය යුතු වුවත්, එසේ ලබා දුන් අවස්ථාව නිරීක්ෂණය විය. |
| (ආ) මුදල් රෙගුලාසි සංග්‍රහය<br>අංක 1646 | සෑම මාසයක් සඳහාම දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊට පසුව එළඹෙන මාසයෙ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) අංක පීඊඩී/12 හා 2003 ජුනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය | අවම වශයෙන් මාස 3 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තු සඳහා රැස්වීම් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | අංක 22/99 1999 ඔක්තෝබර් 06 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.3.1(iii) වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබාදිය යුතු වුවත් නිලධාරීන් 6 දෙනෙකුට වෙන් වෙන්ව වාහන ලබාදී තිබුණි. |
| (ඉ) | 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වෙන්කළ වාහන හැර අනෙකුත් වාහනවල රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම පින්තාරු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | කොමිෂන් සභාවේ මුදල් උපදෙස් අංක 01හි 10 වන වගන්තිය | නිසි ඇස්තමේන්තුගත කිරීම් වලින් තොරව අත්තිකාරම් ලබාදීමත්, ප්‍රථමයෙන් ලබාගත් අත්තිකාරම් නොපියවන ලද නිලධාරීන්ට නැවත අත්තිකාරම් ලබාදීමත් සිදුකර තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතුවලින් රු.1,634,481 ක ඌණතාවයක් වු අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.990,444 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,624,925 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

#### 2.2.1 කාර්ය සාධනය

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය සඳහා වු සංශෝධිත ක්‍රියාකාර සැලැස්මේ වු ඉලක්කයන් ළඟා කර ගැනීමට කොමිෂන් සභාව සමත් වී නොතිබුණි. ළඟා නොවු ඉලක්කයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතන සඳහා මූල්‍යාධාර සැපයීම සඳහා රුපියල් මිලියන 9.865 ක් වෙන්කර තිබුණි. නමුත් කොමිෂන් සභාව මගින් රුපියල් මිලියන 7.374 ක මුදලක් මූල්‍යාධාර ලෙස ප්‍රදානය කර තිබුණු අතර මූල්‍යාධාර ලබාදීමේ කාර්යය සාධනය 75% ක් පමණ විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීමට රුපියල් මිලියන 1 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රුපියල් 806,143 ක් මූල්‍යාධාර ලබා දී තිබුණු අතර එය වර්ෂයේ ප්‍රතිපාදනවලින් 81% ක ප්‍රතිශතයක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ආයතන 204 ක් ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට සැලසුම් කර තිබුණද ලියාපදිංචිය අළුත්කර ඇත්තෙ ආයතන 181 ක් පමණි. එය ඉලක්කගත අගයෙන් 88.7 % ක මට්ටමක පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| පුහුණුව සපයන ආයතනය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය කරනු ලැබූ පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය කරන ලද පාඨමාලා ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය | 05 | 05 | 01 | 20% |
| ජාතික තරුණ සේවා සභාව | 06 | 06 | - | 00% |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 23 | 27 | 12 | 44% |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 135 | 195 | 113 | 58% |
| වෙනත් රාජ්‍ය ආයතන | 07 | 08 | 03 | 37% |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 85 | 79 | 52 | 66% |

පහත නිරීක්ෂණයන් කෙරේ.

(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය පුහුණු පාඨමාලා ප්‍රතීතනය සඳහා අයදුම්පත් 5 ක් ඉදිරිපත්කර , ඇගයීම්කර ඇතත් ප්‍රතීතනය කර තිබුණේ පාඨමාලා 01 ක් පමණි. එය ඇගයුම් කරන ලද පාඨමාලා සංඛ්‍යාවෙන් 20% ක ප්‍රතිශතයක් විය. ජාතික තරුණ සේවා සභාව විසින් ඉදිරිපත් කළ අයදුම්පත් 06 ඇගයුම් කර ඇතත් එකදු පාඨමාලාවක් හෝ ප්‍රතීතනය කර නොතිබුණි.

(ඊ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ප්‍රතීතනය අළුත් කිරීම සඳහා අයදුම්පත් 2 ක් ඉදිරිපත් කර තිබුණි. නමුත් කොමිෂන් සභාව විසින් පෙර වර්ෂයේ ලද අයදුම්පත් සමග පාඨමාලා 10ක් ඇගයීම් කරන ලැබුවද ප්‍රතීතනය

අළුත්කර තිබුණේ පාඨමාලා 02ක පමණි. එය ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාවෙන් 20%ක ප්‍රතිශතයක් විය. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් පාඨමාලා ප්‍රතීතනය අළුත් කිරීම සඳහා අයදුම්පත් 60 ක් ලැබී තිබූ අතර කොමිෂන් සභාව විසින් ඇගයීම් කර තිබුණේ පාඨමාලා 33 ක් එනම් 55% ප්‍රමාණයක් පමණි. පාඨමාලා ප්‍රතීතනය සඳහා ඇගයීමේදී නිර්ණායක රැසක් සපුරාලිය යුතු බවත් අයදුම්පත් ලද පමණින් පාඨමාලා ප්‍රතීතනය කළ නොහැකි බවත් සභාපතිවරයා විගණනයට දැනුම් දී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ අන්තර් ආයතනික කමිටු රැස්වීම් වාර 9 ක් සැලසුම් කොට තිබුණද කමිටු රැස්වීම් 7 ක් පමණක් පවත්වා තිබුණි. නිපුණතා පාදක ඇගයීම් ක්‍රමයේ ඒකමතිකභාවය තහවුරු කිරීමට නිපුණතා පාදක ඇගයීම්කරුවන් සඳහා වැඩමුළු 10 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද වැඩමුළු 5 ක් පමණක් පවත්වා තිබුණි. ඉන් එක් වැඩමුළුවක් පවත්වා තිබුණේ පුහුණු මධ්‍යස්ථාන ප්‍රධානීන් වෙනුවෙන් බවද නිරීක්ෂණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ කළමණාකරණ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා රු.300,000 ක මුල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් කිසිදු මුදලක් ඒ සඳහා වැයකර නොතිබුණි.

### 2.2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

(අ) මූල්‍යාධාර පිරිනැමීම.

----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i ඉකුත් වර්ෂයේදී රු.1,647,699 ක මූල්‍යාධාර ලබාදී තිබුණු පෞද්ගලික අංශයේ ආයතන 10 ක් හා රු.5,565,474 මූල්‍යාධාර ලබාදී තිබුණු රාජ්‍ය අංශයේ ආයතන 17 කින්, දෙපාර්ශවය අතර ඇතිකර ගෙන තිබුණු ගිවිසුම් ප්‍රකාර මූල්‍යාධාර භාවිතා කළ ආකාරය පිළිබඳ ප්‍රගති වාර්තා 2010 මාර්තු 31 දින වන විටත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි. මෙම ආයතන භෞතික පරීක්ෂණයට ලක්කිරීම දුර්වල තත්ත්වයක පැවතුණි.

ii මූල්‍යාධාර ලබා දී තිබුණු පුහුණු ආයතන සමග එළඹී තිබුණු ගිවිසුම්වල 12 වැනි වගන්තිය ප්‍රකාර, ගිවිසුමට එළඹීමෙන් මාස 06 ක් ඇතුළත අදාල පාඨමාලා ප්‍රතීතනය කිරීමට කටයුතු කළ යුතුය. කෙසේ වුවද, එම අවශ්‍යතාවය ඉටුවන පරිදි කටයුතු කර නොතිබුණු අතර වියදම් නොවූ මුදල් නැවත කොමිෂන් සභාව වෙත ගෙන්වාගෙන නොතිබුණි.

iii 2007 වර්ෂයේදී පුහුණු පාඨමාලා 05 ක් ආරම්භ කිරීම සඳහා රු.794,010 ක මූල්‍යාධාර ලබාදී තිබුණු ආයතන 03 ක් සහ 2008 වර්ෂයේදී පාඨමාලා 02 ක් ආරම්භ කිරීම සඳහා රු.79,030 ක මූල්‍යාධාර ලබාදුන් ආයතන 02 ක් විසින් 2009 වර්ෂයේ අවසන් දින වන විටත් එම පාඨමාලා ආරම්භ කර නොතිබුණු බව කොමිෂන් සභාව විසින් කරන ලද භෞතික පරීක්ෂණවලදී තහවුරු කරගෙන තිබුණි. 2010 වර්ෂයේදීත් එම පාඨමාලා ආරම්භ කර ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(ආ) ප්‍රවාහන ඇණය පරීක්ෂාව

-----------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොමිෂන් සභාව සතුව වාහන 12 ක් පැවති අතර රියදුරන් 6 ක් පමණක් සේවයේ යොදවාගෙන තිබුණි. ඒ අනුව වාහන 6 ක් පූර්ණකාලීනව සේවයේ යොදවා නොගෙන නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

(ii) කොමිෂන් සභාව සතුව වාහන 5 ක් නිලධාරීන් සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයීමට අනුයුක්ත කර තිබුණද, එම වාහන කණ්ඩායම් ප්‍රවාහනයට නොව එක් එක් පුද්ගලයන්ට වෙන් වෙන්ව ලබාදී තිබුණි.

(iii) නිලධාරීන් සඳහා අනුයුක්ත කර තිබුණු සංචිත වාහනවල ධාවන සටහන් හා අනෙකුත් ලේඛණ නියැදි පරීක්ෂණයේදී අවස්ථා 63 කදී කිලෝමීටර් 4,034 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(ඇ) වාහන අළුත්වැඩියා හා සේවා කිරීම

------------------------------------

සමාලෝචිත වර්ෂය තුල වාහනයක් අළුත්වැඩියාව වෙනුවෙන් රු.470,295 ක් වියදම් කර ඇතත් විගණන අවස්ථාව වන 2011 අප්‍රේල් 08 දින වන විටත් වාහනය ධාවනයට යොදවා ගෙන නොතිබුණි.

2.2.3 අරමුදල් උපයෝජනය

------------------------

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන බැංකු ජංගම ගිණුම් දෙකෙහි සැළකිය යුතු මුදල් ශේෂයන් නිෂ්ක්‍රීයව රඳවා තිබුණු බව නිරීක්ෂණය විය. එකී බැංකු ගිණුම් දෙකෙහි රඳවා තිබුණු මුදල්වල මාසික සාමාන්‍යය රු.3,540,743 ක් හා රු.4,537,729 ක් විය. ඒ අනුව අතිරික්ත මුදල් ජංගම ගිණුම්වල නොතබා කෙටිකාලීනව ආයෝජනය කර ආදායම් උපයා ගැනීමට තිබුණු විකල්පයන් කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමුකර නොතිබුණි.

2.2.4 **වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් කොමිෂන් සභාවේ සම්පත්**

---------------------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 ඡේදයෙහි දැක්වෙන විධි විධානවලට අනුකූල නොවී 2005 ජනවාරි සිට වාහනයක් වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.

2.2.5 **අයවැය ලේඛනමය පාලනය.**

------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සංශෝධනය කර තිබුණු අතර, එකී සංශෝධිත අයවැය ලේඛනයේ ඇතුළත් සංඛ්‍යාවන් සහ තථ්‍ය සංඛ්‍යාවන් අතරද, සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නැති බව නිරීක්ෂණය විය.

3. **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය කටයුතු
(ඇ) කාර්ය සාධනය
(ඈ) මූල්‍යාධාර ලබා දීම
(ඉ) වාහන උපයෝජනය
(ඊ) සේවක මණ්ඩල කළමනාකරණය